# මහනුවර යුගයේ පහතරට ශෛලියේ විහාර සිතුවම් තුළින් හෙළිවෙන සමකාලීන සමාජ ක්‍රමය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

( බලංගොඩ කොට්ටිඹුල්වල රජමහා විහාරය ඇසුරින්)

එම්.එම්. අසේල චානක මාරසිංහ

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
aselamarasinghe07@gmail.com

ප්‍රමුඛ පදඃ සිතුවම්, මහනුවර යුගය, ලෙන් විහාර, පහතරට චිත්‍ර

## හැඳින්වීම

ලංකා ඉතිහාසයේ චිත්‍ර කලාවන් අතර මහනුවර යුගයේ නිර්මාණය වූ චිත්‍ර කලාවන්ට හිමිවන්නේ විශේෂි ස්ථානයකි. මහනුවර යුගයේ ශෛලීගත චිත්‍ර සම්ප්‍රදාය යනු මහනුවර රාජධානි සමයේ දි විහාර බිත්ති මත නිර්මාණය වූ චිත්‍ර කලාව හඳුන්වන නාමයක් ය. ලෙන් විහාර ටැම්පිටි විහාර ගොඩනැගිලි විහාර ආදියේ බෞද්ධාගමික තේමාවන් මෙසේ චිත්‍රයට නැගී ඇත. මෙම චිත්‍ර ස්වභාවිකත්වයෙන් වෙනස් වේ. සංකේතාත්මක රූප එහි ඇති පැතලි ක්‍රමයට වර්ණ යෙදිම, ද්විමාණ වූ රූප යෙදිම, තිරස් තීරු තුළ චිත්‍ර ඇඳිම මෙම ශෛලියේ ලක්ෂණයි. මෙම ශෛලිය සෑම මහනුවර යුගයේ විහාරයකම සුළු සුළු වෙනස්කම් සහිතව භාවිත වූ බැවින් එකම ශෛලියකට අනුගත වී ඇති බව හඳුනාගත හැකිය. මහනුවර යුගයේ සිටි දෙවරගම්පල සිල්වත් නිලගම චිත්‍ර ශිල්පින් ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටී. දෙගල්දොරුව රජමහා විහාරය, මැදවල ටැම්පිට විහාරය, ලේවැල්ලේ ගංගාරාමය වැනි විහාර මහනුවර යුගයේ බිහි වූ සිතුවම් කලාව අපූර්වට කියාපාන ස්ථානයන් කිපයක් ය. මහනුවර යුගයේ චිත්‍ර සහිත කලාගාරයක් බඳු විහාරයක් ලෙස බලංගොඩ ප්‍රදේශයේ සැඟවීපවතින කොට්ටිඹුල්වල රජමහා විහාරය හඳුනාගත හැකිය. මෙම විහාරයේ පවතින ලෙන් තුළ මහනුවර යුගයට අයත් සිතුවම් දක්නට ලැබේ. කටුඉඹුල් නරකය චිත්‍රය, රෞරව නම් නරකයේ යමරජු නඩු ඇසිම චිත්‍රය, ශක්‍ර භාවන චිත්‍රය, සොලොස්මස්ථාන වන්දනා කරන බැතිමතුන් චිත්‍රය, යන සිතුවම් දෙස අවධානය යොමු කළ විට ඒ තේමාවන් චිත්‍ර ඇදිමේ කලාව මහනුවර යුගයට සමාන බව හදුනාගත හැකිය. මෙය ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතාමත් ස්ථානයකි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය ක්‍රමය මගින් මහනුවර යුගයේ මෙරට නිර්මාණය වූ බිතු සිතුවම් ගැන අවධානය යොමු කරමින් ඒ පිළිබඳ අධ්‍යයනයක් කළ අතර පහතරට සම්ප්‍රදායික ලක්ෂණ ඇති එනමුත් මහනුවර යුගයේ චිත්‍ර ශෛලිය ඇති සබරගමු පළාතේ බලංගොඩ ප්‍රදේශයේ පිහිටි කොට්ටිඹුල්වල රජමහා විහාරය තුළ ඇති බිතු සිතුවම් ගැන තොරතුරු අධ්‍යයනයේ දී නිරික්ෂණ ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ජයාරූප භාවිත කරමින් හා මහනුවර යුගයේ සිතුවම් කලාව පිළිබඳ ලියවූ පොත්පත් ඇසුරින් ලබාගත් තොරතුරු පදනම් කරගෙන දත්ත විශ්ලේශනය කරමින්මහනුවර යුගයේ

පහතරට ශෛලියේ විහාර සිතුවම් තුළින් හෙළිවෙන සමකාලීන සමාජ ක්‍රමය මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් ඉදිරිපත් කරයි.

## ප්‍රතිඵල හා සාකච්ඡා

මහනුවර යුගයේ චිත්‍ර මූර්ති කැටයම් සහිත කලාගාරයක් බඳු වූ විහාරයක් බලංගොඩ ප්‍රදේශයේ සැඟවී පවතින බව බොහෝ දෙනා නොදන්නා කරුණක් ය. මෙහි ඇති එක් චිත්‍රයක් වන කටුඉඹුල් නරකය චිත්‍රය අතීතයේ දි විහාරයට පැමිණි බැතිමතුන් මෙම චිත්‍රය බැලීමට මුල් තැනක් දි ඇත. ඒ නිසාම අතීතයේ පටන් ම කටු ඉඹුල විහාරය ලෙස හඳුන්වන ලදුව අද වන විට කොට්ටිඹුල්වල රජමහා විහාරය යැයි හඳුන්වයි. මෙය ලෙන් විහාරයකි. නමුත් එම ලෙන් විහාර ප්‍රතිසංකරණය මහනුවර යුගයේ සිදු වූ අකාරයක් දැක්නට ලැබේ. එමනිසා මෙම විහාරය තුළ ද මහනුවර යුගයේ කලා ලක්ෂණ දැකගත හැකිය. මහනුවර ප්‍රදේශයෙන් ගෙන්වාගත් කලා ශිල්පීන් වෙනුවට පහතරට ප්‍රදේශයෙන් ගෙන්වාගත් ශිල්පින් විසින් මෙම විහාරය ප්‍රතිසංස්කරණය කරන විට චිත්‍ර ඇඳි ආකාරයක් දක්නට ලැබේ. කටු ඉඹුල් නරකය චිත්‍රය මෙම විහාරය පිවිසිමේ කොරිඩෝවේ දැව සිවිලිමේ දක්නට ලැබේ. විහාරයට පැමිණෙන බැතිමතුන්ට කුසල් අකුසල්වල විපාක කියාපාන මෙම සිතුවම තුළ කටු ඉඹුල් ගස ඉතා උල් සහත අතු අගිසිවලින් යුතුය. ගසට නැග සිටින නිරුවත් ගැහැණු පිරිමි එම උල් ඇනි වේදනා විදින ආකාරය හා ගස පාමුල යම පල්ලන් දෙදෙනෙක් සිටින ආකාරයක් දක්නට ලැබේ. එසේම ශක්‍ර භවන චිත්‍රය මෙම සිතුවම ද සිවිලිමේ ඇඳ ඇති අතර ශක්‍ර දෙවියන් චිත්‍රයේ කේන්ද්‍ර කරගෙන දෙපස පිරිවරා සිටින දෙවිවරු හා අප්සරාවන් දක්නට ලැබේ. මෙම පිරිස යුරෝපිය ඇඳුමින් සැරසි සිටි සාය **තැට්ට** ඇඳුම් ඒ අතර වේ. අප්සරාවන් පැළඳ සිටින කුරුසිය සහිත මාලය මෙහි කැපී පෙනේ මහනුවර යුගයේ චිත්‍ර වුවද පහතරට ප්‍රදේශවල කිතු දහම වැළඳගත් ජනතාව සහ ඔවුන් කර පැළඳි කුරුසි සහිත මාලය පිළිබඳ දැනුමක් ඇති චිත්‍ර ශිල්පියෙකු විසින් මෙම චිත්‍රය ඇඳි බව මින් මනාව පැහැදිලි වන කරුණක් ය. එසේම අනෝතප්ත විල චිත්‍රය බෞද්ධ ඉතිහාසයේ කියැවෙන අනෝතප්ත විල ඉන්දියාවේ හිමාල ප්‍රදේශයේ කෛලස කැටය අසල ඇතැයි සැලකේ. මෙම විලෙන් පටන්ගෙන සිවු දිගට ගලායන ගංගා හතරකි. එම ලක්ෂන සහිතව අනෝතප්ත විල අනෝතප්ත විලය. විහාරයේ සිවිලිමේ ඇඳ ඇත චිත්‍රයේ පහළ කෙලවරේ මුහුද දක්වා ඇත. එම මුහුදේ යාත්‍රා කරන නැවතී එම නැවේ රුවල් සමඟ දුම් කවුළු දෙකක් ද ඇත. එම දුම් කවුළු දෙකෙන් කළු දුම් අහසට නගින ආකාරය දැක්වේ. මෙවන් නැවක් මහනුවර යුගයේ චිත්‍රයක දක්නට තිබීමත් විශ්මයට කරුණක් ය. ඊටත් වඩා විශ්මය දනවන කරුණයක් වන්නේ නැව් බඳේ සිටින නාවිකයෙකු තනි ඇස් සහිත දුර දක්නයකින් අවට පිරික්සන ආකාරය චිත්‍රයට ඇතුළත් කර තිබිම ය. මෙම ආකාරයට මහනුවර යුගයට අයත් වූ නමුත් කන්ද උඩරට චිත්‍ර කලාවේ ලක්ෂණ මහනුවර යුගයේ ප්‍රතිසංස්කරණයටලක් වූ මෙම කොට්ටිඹුල්වල රජමහා විහාරයේමහනුවර යුගයේ පහතරට ශෛලියේ විහාර සිතුවම් තුළින් හෙළිවෙන සමකාලීන සමාජ ක්‍රමයඅපූර්ව ආකාරයට හඳුනාගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ශ්‍රි සුමංගල හිමි, හික්කඩුවේ., දේවරක්ඛිත, බටුවන්තුඩාවේ. (2003)(සංස්). *මහාවංසය.*බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.